**"1994 අංක 13 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතේ 5 වන වගන්තියේ 5 වන අනු වගන්තිය අනුව 2017.09.14 දින නිකවැරටිය මිල්ලගොඩ රිදීබැඳිඇල නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ දී පැවති පෙර වගා රැස්වීමේ දී රිදීබැඳි ඇල මහ වාරිමාර්ග ව්‍යාපාරයේ 2017/18 මහ කන්නය සඳහා යෝජිත වගා කාල සටහන"**

- වගා රැස්වීම සඳහා යෝජිත දිනය :- 2017.10.03
- වගා කිරීමට අපේක්ෂිත බෝග වර්ගය :- මාස 3-3 1/2 වී සහ අමතර ආහාර බෝග
- වගා කිරීමට යොජිත බිම් ප්‍රමාණය :- අක්කර 6000

| අනු අංකය | කාරණය | |
|---|---|---|
| 01 | වගා කිරීමට අපේක්ෂිත බෝග වර්ගය | මාස 3, 3 1/2 වී අමතර බෝග |
| 02 | වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය | අක්කර 6000 |
| 03 | වගා කිරීමට යෝජිත ප්‍රදේශ | මුළු ව්‍යාපාර බල ප්‍රදේශය |
| 04 | මුල් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | 2017.10.20 |
| 05 | බිම් සැකසීම, වැපිරීම අවසන් කළයුතු දිනය | 2017.11.20 |
| 06 | මුර ජලය ආරම්භ කරන දිනය | 2017.11.23 |
| 07 | අවසන් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | 2018.02.20 |
| 08 | ගොවිසංවිධාන හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන ඇල හා බෙදුම් ඇලවල්, කෙත් ඇලවල් වල නඩත්තු කටයුතු අවසන් කළයුතු දිනය | 2017.10.15 |
| 09 | වගා රක්ෂණය අවසන් කළයුතු දිනය | 2017.1120 |
| 10 | වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය | 2018.02.20 |
| 11 | අස්වනු නෙලා අවසන් කළයුතු දිනය | 2018.03.15 |
| 12 | 2018 යල කන්නය සඳහා කෙතට පිදුරු යෙදීමේ දිනය | 2018.03.20 |

**1994 අංක 13 දරණ (සංශෝධිත) වාරිමාර්ග ආඥා පනත 11 උප වගන්තිය අනුව ඉදිරි කන්නයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත නීති රීති**

- අනවසරයෙන් ජලය ලබාගන්නා ඇලවල් වාරිමාර්ග අඥාපණත හා ගොවිජන සංවර්ධන පණතේ විධිවිධාන යටතේ වසා දැමීම කලයුතුය
- ජල ගැලීම් හේතුවෙන් වගාව ස්ථාපිත කිරීමට ප්‍රමාදවන කුඹුරු ඉඩම් සම්බන්ධව තීරණ ගැනීම ව්‍යාපාර කළමනාකරණ කමිටුවකදී කළයුතුය
- ව්‍යාපාර කළමනාකරණ කමිටුවට උක්ත කාලසටහන වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම සඳහා බලය පැවරේ.
- කෙත් ඇලවල් සහ බෙදුම් ඇලවල් වල නඩත්තුව සඳහා අක්කර 1 කට රු. 500/= ක මුදලක් ගොවිසංවිධානයට ගෙවිය යුතුය. ( වෙනත් බෝග වගා ප්‍රදේශවල අක්කරයකට රු. 500 ක් අයකල යුතුය )
- ව්‍යාපාර කමිටුව විසින් සකස් කරනු ලබන මුර ක්‍රමයට ව්‍යාපාරයෙන් ජලය ලබා ගන්නා සියළු දෙනා අවනත විය යුතු අතර පිවිසුම් ඇල හා ප්‍රධාන ඇලවල් හා අනිකුත් ඇලවල් අනවසරයෙන් හරස් කිරීම සපුරා තහනම්.
- පිදුරු පිලිස්සීම සපුරා තහනම්වේ. පිදුරු පුලුස්සන ගොවීන් සඳහා පොහොර සහනාධාරය හිමි නොවේ. එසේ වුවද ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකවරයා සෑහීමට පත්වන ලෙස කාබනික පොහොර ගොවියා යොදන්නේනම් සහනාධාර පොහොර ලබා දීම සිදුකල හැකිය.

- ගොවි සංවිධාන විසින් පොදු කටයුත්තක් වෙනුවෙන් සූදානම් කර සාමාජිකයින් වෙත දැනුම් දෙනු ලබන ශ්‍රමදාන වැඩ සටහන් සඳහා සහභාගී නොවන සාමාජිකයකුගෙන් රු. 500/= ක මුදලක් ගොවි සංවිධානය වෙත අයකර ගැනීමට ගොවි සංවිධානයට බලය පැවරීම.
- කිරිඳිගල්ල ගොවි සංවිධාන බල ප්‍රදේශයේ හා ඕතොට දිවුල්ලැව ගොවි සංවිධාන බල ප්‍රදේශවල ඇල පද්ධතියක් හෝ කුඹුරු බට නොමැති බැවින් එම ප්‍රදේශවලට ව්‍යාපාර කමිටුවේ සකස් කරන මුර කාලසටහන අනුව බට දමා ජලය ලබා ගැනීමට හැකි අතර අනෙකුත් ගොවි සංවිධාන බල ප්‍රදේශවල පිවිසුම් ඇළ හෝ ප්‍රධාන ඇලවල්වලට හෝ බට දමා ජලය ලබා ගැනීම සපුරා තහනම් වන අතර උක්ත ගොවි සංවිධාන දෙකද තම ගොවි සංවිධානයට හිමි ජල මුර දිනවලදී පමණක් පාලනයක් ඇතිව බටදමා ජලය ලබා ගත යුතුය.
- ජලය නිකුත් කිරීම අවසන් යෝජිත දිනයෙන් පසු ජලය ඉල්ලීම වෙනුවෙන් ව්‍යාපාර කළමනාකරණ කමිටුවක තීරණයක් ගත යුතු අතර අමතර ජලය ලබාදීම වෙනුවෙන් මුදලක් නියම කිරීම කල යුතුය. ( අමතර ජලය වෙනුවෙන් ව්‍යාපාර කමිටුව විසින් අක්කර 1 කට අය කරන මුදල තීරණය කල යුතුය )
- ගවයින් මගින් මේ වනවිට සී සෑම හෝ ගොයම් මැඩීම නොකරන බැවින් ගවයින් යායට ඇතුළු කිරීම සපුරා තහනම් වන අතර වගාවට හා වාරිමාර්ග නිර්මිත වලට හානි වන අයුරින් ගවයින් බැඳීම හෝ නිදැල්ලේ යැවීම තහනම් වේ. තවද වාරිමාර්ග නිර්මිතවලට හෝ යායට ලණු සහිතව හෝ රහිතව ඇතුළු කිරීම සඳහා එක් ගවයකු සඳහා රුපියල් 1000/= ක අවමයකට යටත්ව දඩ මුදලක් ගොවිජන සේවා කමිටුවට අය කර ගැනීම කල යුතුය .
- ඇලවේලි හා කෘෂි මාර්ගවලට හානිවන පරිදි කොළ මැඩීම වෙනුවෙන් රුපියල් 5000/= ක දඩයක් වරද කරන පුද්ගලයාගෙන් අදාල ගොවි සංවිධානය විසින් අය කල යුතුය
- වාරිමාර්ගවලට හානි කර නිර්මිත හරහා කුඹුරු ඉඩම්වලට වාහන ගන්නේනම් තම කාර්යය ඉටුකර ගත් වාහම නිර්මිතය පෙර තිබූ තත්වයට සකස් කල යුතුය. එසේ නොකරන ගොවීන් විසින් ගොවි සංවිධානය වෙත රුපියල් 5000/= ක අවමයකට යටත්ව දඩ මුදලක් අය කල හැකිය.
- ප්‍රධාන ඇල පද්ධතිය තුළ හා ඇලවේලිවල ගවයින් බැඳීම වෙනුවෙන් වන අලාභය, තක්සේරු කර අයකර ගැනීමට වාරිමාර්ග ඉංජිනේරුතුමාට හැකියාව ඇත. මේ සඳහා ගොවි සංවිධානවල සහය ලබාදිය යුතු වේ. තවද ගොවිසංවිධානවලට මහ සභාවේ එකගතාවය අනුව ගවයින් බැඳීම සඳහා නියෝජිතයෙකු පත්කර ගත හැකි අතර මෙම නියෝජිතයාට දිස්ත්‍රික් ලේකම්තුමා මගින් පත්වීම් ලිපියක් ලබා දීමට කටයුතු කළ හැකිය.

**2017/18 මහ කන්නය වෙනුවෙන් කන්න රැස්වීමට ඉදිරිපත් කිරීමට රිදිබැඳිඇල ව්‍යාපාරයේ උක්ත වගා කාලසටහන සහ රීති මාලාව සුදුසු බවට බුදුමුත්තාව ගොවිසංවිධානයේ ගරු සභාපති ඊ.එම්. කුණතිලක මහතා යෝජනා කළ අතර කටගමුව ගොවි සංවිධානයේ ලේකම් පී.ඩී. නිහාල් කුමාර මහතා ස්ථිර කර සභා සම්මත කරගන්නා ලදි.**

සහයෝගය ලබාදුන් සියළුම රාජ්‍ය නිලධාරීන් ට හා ගොවිසංවිධාන නිලධාරීන්ට ස්තුතිය ප්‍රකාශ කරමින් පෙර කන්න රැස්වීම අවසන් කරන ලදි.



..............................................

ආර්.එම්. රාජරත්න

නේවාසික ව්‍යාපෘති කළමනාකරු

රිදිබැඳි ඇල ව්‍යාපාරය